Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය පිළිබඳ ඇගයීමක් ඃ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ පෞද්ගලික බස්රථ සේවාව ඇසුරින්

**එම්.ඒ.සී.එස්.එම්. නන්දසේන සහ තවත් අය [1]**

**එම්.කේ.නදීකා දමයන්ති [2]**

**සංක්ෂේපය**

ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය යනු ඕනෑම රටක ආර්ථිකය සම්බන්ධයෙන් බලපෑම් කරනු ලබන්නකි. රටේ ප්‍රවාහන ප්‍රතිපත්තිය තුළින් මූලික වශයෙන්ම බලාපොරොත්තු වන්නේ මහජනතාවගේ ගමනාගමන කටයුතු මෙන්ම භාණ්ඩ ප්‍රවාහන සේවා කාර්යක්ෂමව සිදු කිරීමයි. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සැකසීමේ මූලික වගකීම ප්‍රවාහන අමාත්‍යාංශය වෙත පැවරෙන අතර ජාතික ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය යන ආයතන ද මේ කාර්යයේදී දායක වේ. මෙම අධ්‍යයනයේදී ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තියෙහි ප්‍රධාන මූලිකාංග දෙකක් එනම් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය හා පෞද්ගලික බස් ප්‍රවාහන සේවය පිළිබඳව අවධානය යොමු කෙරේ. ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ප්‍රතිපත්තිය 1991දී සකස් කරන ලද අතර 2009දී එය නැවත සංශෝධනය කර ඇත. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයක් වූ මහින්ද චින්තනය තුළ ද ප්‍රවාහනය සම්බන්ධ විධිවිධාන ඇතුළත් කර ඇත. මෙම අධ්‍යයනයේදී ප්‍රධාන ගැටලුව වන්නේ ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය නිසියාකාරව ක්‍රියාත්මක වන්නේද? යන්න අධ්‍යයනය කිරීමයි. අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත භාවිත කෙරිණි. ප්‍රාථමික දත්ත ලබා ගැනීමේදී අහඹු ලෙස තෝරා ගන්නා ලද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සහ පෞද්ගලික බස් රථවල රියදුරන් සහ කොන්දොස්තරවරු 20දෙනෙක් ද මගීහු 50 දෙනෙක් අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදහ. මගීන්ගෙන් 70%ක් දෛනික ප්‍රවාහන කටයුතු සඳහා පෞද්ගලික බස් රථ හෝ ලංගම බස් රථ යොදා ගනු ලැබූ අතර 30%ක් සාමාන්‍යයෙන් බස් රථ භාවිත කළ මගීන්ය. ඔවුන්ගෙන් 40%ක් ප්‍රවාහන ප්‍රතිපත්තිය පිළිබඳ අවබෝධයක් පැවති අතර 60%ට ඒ පිළිබඳ අවබෝධයක් නොවීය. ශ්‍රී ලංගම බස් රථ සේවකයන්ගෙන් 40%ක් ප්‍රවාහන ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත්ව සිටි අතර 30%ක් යම්තාක් දුරකට ද 30% ප්‍රතිපත්තිය පිළිබඳ අවබෝධයක් ද නොවීය. එමෙන්ම පෞද්ගලික බස් රථ සේවකයන්ගෙන් 80%ට ප්‍රවාහන ප්‍රතිපත්තිය පිළිබඳ අවබෝධය ඇත්තේ යම්තාක් දුරකට පමණි. අධ්‍යයනයට අනුව මගීන්ගෙන් 33.3%ක අදහස වූයේ කාර්යක්ෂම මගී ප්‍රවාහන සේවයක් ඔවුන්ට නොලැබෙන බවයි.එමෙන්ම මගීන් 60%ක අදහස වන්නේ සුවපහසු ප්‍රවාහන සේවයක් ඔවුන්ට හිමි නොවන බවයි. අධ්‍යයනයට අනුව ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක නොවේ.

මුඛ්‍ය පදඃ- මගී ප්‍රවාහන ප්‍රතිපත්තිය, ප්‍රවාහනය, මගීන්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, පෞද්ගලික බස් රථ

එම්.ඒ.සී.එස්.එම්. නන්දසේන
එම්.එල්. සෙව්වන්දි,
එස්.පී.එම්.ආර්.එච්. සෙනවිරත්න,
වී.ටී. කුලසූරිය
අයි.එච්.අයි.එම්. බණ්ඩාර
[2]නදීකා දමයන්ති *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*